// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2303/08 - 2022 ඔක්තෝබර් මස 26 වැනි බදාදා - 2022.10.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

### පෙත්සම පිළිබඳ දැන්වීම

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 32 සහ 37(5) දරන වගන්ති සමග කියවිය යුතු 2007 අංක 7 දරන සමාගම් පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව අධිකරණයේ අධීක්ෂණයට යටත්ව ද ෆිනෑන්ස් කම්පැණි පී. එල්. සී හෙවත් ද ෆිනෑන්ස් කම්පැණි ලිමිටඩ් (පී කිව් 1) ගණන් බේරා වසා දැමීම

**ඒ අනුව මුදල් ව්‍යාපාර පනතේ 37 (5) වගන්තියේ ප්‍රකාශිත ප්‍රතිපාදන වලට යටත්ව,**

ඉහත නම් දරන සමාගම කොළඹ වාණිජ මහාධිකරණයේ අධීක්ෂණයට යටත්ව ගණන් බේරා වසා දැමීම සඳහා වූ පෙත්සමක් 2021 පෙබරවාරි 16 වන දින, කොළඹ 01 පිහිටි ශ්‍රී ලංකා මහ බැංකුවේ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ එවකට අධ්‍යක්ෂ වූ ජයකොඩි ආරච්චිගේ දොන් සමන් ජයනාත් නානායක්කාර යන අය විසින් එකී අධිකරණයට ඉදිරිපත් කරන ලද බව ද, ඉහත කී පෙත්සම 2022 දෙසැම්බර් මස 08 වන දින අධිකරණය ඉදිරියේ විභාගයට ගනු ලැබීමට නියම කර ඇති බවද, සහ එකී පෙත්සම මත ආඥාවක් කරනු ලැබීම තහවුරු කිරීමට හෝ ඊට එරෙහි වීමට හෝ උත්සුක වන ඉහත කී සමාගමේ ඕනෑම ණය හිමියෙකුට හෝ සහදායකයෙකුට එකී කාර්යය සඳහා නඩු විභාගයේදී තමාම හෝ ඒ තැනැත්තාගේ නීතිඥවරයා මගින් පෙනී සිටීමට හැකි බව ද, පෙත්සමේ පිටපතක් එය අවශ්‍ය කරන එකී සමාගමේ ඕනෑම ණය හිමියෙකුට හෝ සහදායකයෙකුට පහත අත්සන යොදා ඇති තැනැත්තා විසින් නියම කරන ලද ගාස්තුව ගෙවීම මත සපයනු ඇති බව ද මෙයින් දන්වනු ලැබේ.

අධ්‍යක්ෂ,
බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව.

ශ්‍රී ලංකා මහ බැංකුව,
අංක 30, ජනාධිපති මාවත,
කොළඹ 01.

1A - G 37866 — 26 (2022/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*සටහන* : එකී පෙත්සම විභාගයේ දී පෙනී සිටීමට අදහස් කරන ඕනෑම තැනැත්තකු ඔහුගේ එකී අදහස පිළිබඳ ලිඛිත දැන්වීමක් ඉහත නම් සඳහන් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත භාර දීම හෝ තැපෑලෙන් යැවීම කළ යුතුය. දැන්වීමෙහි, තැනැත්තාගේ නම සහ ලිපිනය, හෝ ආයතනයක් නම් ආයතනයෙහි නම සහ ලිපිනය සඳහන් කළ යුතු අතර, තැනැත්තා විසින් හෝ ආයතනය විසින් හෝ තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ නීතිඥවරයා (සිටී නම්) විසින් හෝ අත්සන් කරනු ලැබිය යුතු අතර, 2022 දෙසැම්බර් 06 දින ප.ව. 6.00 පසු වීමට පෙර භාර දීම හෝ තැපෑලෙන් යවන්නේ නම්, ඉහත නම් දරන අය වෙත ළඟා වීමට ප්‍රමාණවත් කාලයක් සහිතව යවනු ලැබීම කළ යුත්තේය.

EOG 10 - 0230

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.